**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**

# පුවත්පත් නිවේදනය

## <u>ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගෙන් අග්‍රමාත්‍ය මෝදි මැතිතුමාට සුබ පැතුම්</u>

## අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා ශ්‍රී ලංකාව සමඟ වඩා ශක්තිමත් බැඳීම් සඳහා ඉන්දියාවේ අඛණ්ඩ කැපවීම අවධාරණය කරයි

## නායකයන් දෙපළම දැක්ම ලේඛනය සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරති

ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා දුරකථනයෙන් ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා අමතා එතුමාගේ ඓතිහාසික මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් සුබ පැතුම් පිරිනැමීය.

2. අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා ජනාධිපති වික්‍රමසිංහ මැතිතුමාගේ උණුසුම් සුබ පැතුම් සම්බන්ධයෙන් ස්තුතිය පළ කළේය. එතුමා ඉන්දියාවේ අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තිය සහ SAGAR දැක්ම අනුව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වඩා ශක්තිමත් බැඳීම් ගොඩනැගීම සඳහා ඉන්දියාවේ අඛණ්ඩ කැපවීම අවධාරණය කළේය.

3. නායකයන් දෙපළ ජනාධිපති වික්‍රමසිංහ මැතිතුමාගේ 2023 ජූලි මස නවදිල්ලි සංචාරය අතරතුර නිකුත් කරන ලද දැක්ම ලේඛනය ක්‍රියාත්මක කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇති බව ද සඳහන් කළහ. විශේෂයෙන්ම, නායකයන් දෙපළ ම අන්‍යෝන්‍ය වර්ධනය, සංවර්ධනය සහ සෞභාග්‍යය වේගවත් කිරීම උදෙසා සියලු පැතිකඩවල සම්බන්ධකතාවය ඉහළ නැංවීමේ ප්‍රගතිය වේගවත් කිරීමට සිය කැපවීම අවධාරණය කළහ.

***

***කොළඹ***
***2024 ජූනි 06***

මූලාශ්‍රය:
https://pib.gov.in/PressReleseDetailm.aspx?PRID=2022976